# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,078 - 2018 ජුනි මස 29 වැනි සිකුරාදා - 2018.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1068 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1076 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. - (i) අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය පනත් කෙටුම්පත 2018 ජුනි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සුරා බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2018 ජුනි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජූලි මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූලි 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පිරවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | සෞඛ්‍ය කම්කරු III පන්තිය | 01 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට (02) සම්මාන සහිතව විෂයයන් හයක් (06) සාමාර්ථය ලබා තිබීම. මින් විෂයයන් පහක් (05) එක් වරකදී සමත්ව තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර)<br><br>ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පමණක් පරිපාටියේ සඳහන් සුදුසුකම් අනුව පහ (05) ශ්‍රේණිය සමත් වීම සලකා බැලිය හැකිය. |
| 02. | මුරකරු III පන්තිය | 01 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට (02) සම්මාන සහිතව විෂයයන් හයක් (06) සාමාර්ථය ලබා තිබීම. මින් විෂයයන් පහක් (05) එක් වරකදී සමත්ව තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර) |

*02. බඳවා ගැනීමේ කොන්දේසි :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නව වසර 03 ක කාලයක් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි අයකු විය යුතුය. (පදිංචි සහතික ඉදිරිපත් කළ යුතුය.)
3. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.
4. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
5. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.
6. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් හා ප්‍රාදේශීය සභාව සතු වේ.
7. දැනටමත් පළාත් රාජ්‍ය සේවය යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවයේ නියුතු අය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
8. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කර ඇති සහ සේවය කරනු ලබන මූලික සුදුසුකම් සපුරාලන අය සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
3. බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01ක වැඩ බැලීමේ කාලයකට යටත් ව බඳවාගනු ලැබේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත් විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත් දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතුයි.
5. බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මධ්‍යම පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද මධ්‍යම පළාත් සභාවේ හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.
6. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. තෝරාගනු ලැබුවහොත් මසක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනුලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.
8. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතු ය.

04. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව 8.27" x 11.69" (A4) පරිමාණයේ කඩදසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2018.06.30 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව, කුරුඳුවත්ත කඩ වීදිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය. තැපෑලේදී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. ජාතික හැඳුනුම්පත;
3. අධ්‍යාපන සහතික;
4. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය;
5. වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික;
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
7. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

යූ. පී. ජයරත්න,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව,
කුරුඳුවත්ත කඩ වීදිය.

2018 ජුනි මස 12 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**
**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව**

***..........................තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :——————————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.

03. ස්ථිර ලිපිනය :————————————.

04. උපන් දිනය : අවුරුද්ද :—————. මාසය :—————. දිනය :—————.

05. විවාහක අවිවාහක බව :————————————.

06. ජාතිය :————————————.

07. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද ?
එසේ නම් පරම්පරාවෙන්ද?, ලියාපදිංචි වීමෙන්ද? යන වග :————————————.

08. අධ්‍යාපන සුදුසුකම් :————————————.

අ.පො.ස. සා. පෙළ විභාගය

සමත් වර්ෂය :————— විභාග අංකය :—————

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 01 | | 06 | |
| 02 | | 07 | |
| 03 | | 08 | |
| 04 | | 09 | |
| 05 | | 10 | |

09. (1) වෙනත් සුදුසුකම් :—————.
(2) වෘත්තීය සුදුසුකම් :—————.
(3) සේවා පළපුරුද්ද :—————.
(4) සියලුම අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල පිටපත් ඉල්ලුම්පත සමග අමුණා එවිය යුතුය.

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? :————————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බවත් පත් වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

.............................. ,

දිනය :—————. අයදුම්කරුගේ අත්සන.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ..........................................................................මයා/මිය/මෙනවිය මෙම ආයතනයේ ස්ථිර/අනියම්/කොන්ත්‍රාත් පදනම මත ................................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් දැනට කරන ස්ථිර සේවයෙන් නිදහස් කළ හැක./නොහැක.

.................................................... ,

නම :————————————. ආයතන ප්‍රධානියාගේ අත්සන.

පදවිය :————————————.

දිනය :————————————.

06-995

---

## බියගම ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

01. බියගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාළ සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) | අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) |
| 01 | පුස්තකාල සහායක III (ප්‍රාථමික ශිල්පීය නොවන) | 01 | PL 1 - 2016 රු. 24,250- 10x250- 10x270- 10x300- 12x330- රු. 36,410 (රා. ප. ච. 03/2016 අනුව) | – | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා./පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් (06)ක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.) | – | අදාළ නොවේ. |
| 02 | සෞඛ්‍ය කම්කරු III (ප්‍රාථමික ශිල්පීය නොවන) | 02 | PL 1 - 2016 රු. 24,250- 10x250- 10x270- 10x300- 12x330- රු. 36,410 (රා. ප. ච. 03/2016 අනුව) | – | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය / 9 වසර සමත් විය යුතුය. | – | අදාළ නොවේ. |
| 03 | ආදාහනාගාර ක්‍රියාකරු III (ප්‍රාථමික අර්ධ ශිල්පීය) | 02 | PL 2 - 2016 රු. 25,250- 10x270- 10x300- 10x330- 12x350- රු. 38,450 (රා. ප.ච. 03/2016 අනුව) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා./පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාරගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් (06)ක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් විය යුතුය. | *වෘත්තීය සුදුසුකම් :* ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුයි). | *වෘත්තීය සුදුසුකම් :* ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම හා අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුයි). |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) | අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) |
| | | | | | | පළපුරුද්ද : පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05ක් සපුරා ඇති අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්, වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයෙකු විය යුතු ය. | |
| 04 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III (ප්‍රාථමික ශිල්පීය නොවන) | 02 | PL 1 - 2016 රු. 24,250- 10x250- 10x270- 10x300- 12x330- රු. 36,410 (රා. ප. ච. 03/2016 අනුව) | – | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය / 9 වසර සමත් විය යුතු ය. | – | අදාළ නොවේ. |
| 05 | මුරකරු III (ප්‍රාථමික ශිල්පීය නොවන) | 01 | PL 1 - 2016 රු. 24,250- 10x250- 10x270- 10x300- 12x330- රු. 36,410 (රා. ප.ච. 03/2016 අනුව) | – | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා./පෙළ විභාග යේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් (06)ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතු ය.) | – | අදාළ නොවේ. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) | අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) |
| 06 | රියදුරු III (ප්‍රාථමික ශිල්පීය) | 01 | PL 3 - 2016 රු. 25790- 10x270- 10x300- 10x330- 12x350- රු. 38,990 (රා. ප.ව. 03/2016 අනුව) | | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා/ පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාරගණනකදී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව ඇතුලුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම (එක් වරකදී විෂයයන් පහක් (05) ක් අවම වශයෙන් සමත්ව තිබිය යුතුය. | | *වෘත්තීය සුදුසුකම්:*<br>(i) බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් "ඒ1" සහ "සී1" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" සහ "ඩී1" පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.<br>(ii) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය<br>*පළපුරුද්ද :*<br>(i) බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පලපුරුද්දක් තිබිය යුතුය.<br>(පලපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)<br>*කායික සුදුසුකම් :*<br>(i) අවම උස අඩි 05ක් විය යුතුය<br>(ii) දිවා කාලයේ හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය. |

*බඳවා ගැනීමේ ක්‍රමය* ඃ

(i) ඉහත අංක 01, 02, 03, 04, 05 යටතේ සඳහන් තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙන අතර එහිදී මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් තනතුරට අදල ප්‍රායෝගික දැනුම පළපුරුද්ද, කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය, පෞරුෂත්වය යනාදිය සලකා බලනු ලබන අතර එහිදී වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙලට අනුව බඳවා ගනු ලැබේ.

(ii) ඉහත අංක 06 යටතේ සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමේදී වෘත්තීය පරීක්ෂණයක් පැවැත්වෙන අතර, රිය පැදවීමේ නිපුණත්වය, මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරනු ලබන අතර එහිදී වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙලට අනුව බඳවා ගනු ලැබේ.

03. *වයස* ඃ- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18 ට නොඅඩු අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

04. *වෙනත් සුදුසුකම්* ඃ-

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්කරු ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ග්‍රාම නිලධාරී/ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)
(iv) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහ කරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/ 90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතුය.
(vi) අවශ්‍ය වෙතොත් සභාව විසින් නියම කරනු ලබන ඇපයක් මුදලින් හෝ රක්ෂණ සහතිකයක් මගින් තැබීමට සූදානම් විය යුතුය.

05. *පොදු කොන්දේසි* ඃ-

(i) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර මනා පෞරුෂයකින් යුක්ත විය යුතු ය.
(ii) මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.),
(iii) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය,
(iv) පරිවාස කාලය අවසානයේ ස්ථිර කිරීම සලකා බලනු ලැබේ,
(v) මුල් පත්වීම් දින සිට වසර 3ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය,
(vi) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය,
(vii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය,
(viii) බඳවා ගැනීමෙන් පසුව ඔබ විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ වෙනත් සුදුසුකම් ව්‍යාජ හෝ අසත්‍ය බවට තහවුරු වුවහොත් වෙනත් කිසිම දැනුම්දීමකින් තොරව පත්වීම අවසන් කරනු ලැබේ,
(ix) මීට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, මුදල් රෙගුලාසිවලටද බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතුය.

06. *අයදුම්පත්* .- අයදුම්කරුවන් මෙම උප ලේඛනයේ දක්වෙන ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2018.07.13 වැනි දිනට පෙර "ලේකම්, බියගම ප්‍රාදේශීය සභාව, දෙල්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ "අයදුම් කරන තනතුර" සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේ දී නැතිවන අයදුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

07. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

08. අයදුම්පත් සමග පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය,
*(ආ)* අධ්‍යාපන සහතිකය,
*(ඇ)* ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,
*(ඈ)* ප්‍රදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
*(ඉ)* මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් පදිංචි වසමේ ග්‍රාමසේවා නිලධාරිගෙන්),
*(ඊ)* වෘත්තීමය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දක්වෙන සහතික,
*(උ)* දැනටමත් සේවයේ යෙදෙන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදළ නව බඳවා ගැනීමේ පරිපාටි, ව්‍යවස්ථා සංශෝධනයවීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල බියගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වන්නේ ය.

වසන්ති වික්‍රමරත්න,
ලේකම්,
බියගම ප්‍රාදේශීය සභාව.

2018 ජුනි මස 05 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*බියගම ප්‍රාදේශීය සභාව*

**........................................................ *තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ නම / (මුලකුරු සමග) : .........................................................................
   මුලකුරුවලින් හැඳින්වෙන නම් : .........................................................................
2. තැපැල් ලිපිනය : .........................................................................
3. උපන් දිනය : අවුරුද්ද : ........................... මාසය : ..................... දිනය : .....................
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු : .............. මාස : ............. දින : ..........
5. විවාහක / අවිවාහක බව : ....................
6. ජාතිය : ..................
7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග ..................
8. අධ්‍යාපන සුදුසුකම් : ......................................................
9. වෘත්තීය සුදුසුකම් : ......................................................
10. පළපුරුද්ද :

| *ආයතනය* | *තනතුර* | *සේවා කාලය* |
|---|---|---|
| | | |

11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :
    (i) දැනට දරන තනතුර : ............................................
    (ii) එම තනතුරට පත් වූ දිනය : ................................
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ අනියම්/ තාවකාලික/ ආදේශක/ කොන්ත්‍රාත්/ පදනම මත ද) :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

.......................................... ,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ................................

06-1105

# පළාත් පාලන නිවේදන

## රිදීගම ප්‍රාදේශීය සභාව

2018.05.11 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2071 දරන *ගැසට් පත්‍රයේ* පළවූ අංක 05-268 නිවේදනයේ සඳහන් එගොඩමුල්ල සමාගම්වත්ත මාර්ගය සම්බන්ධව පළවූ නිවේදනය පහත සඳහන් උපලේඛනයේ පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් හෝ යම් විරෝධතාවක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට ලිත් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 24 (2) වගන්තියේ ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත ප්‍රාදේශීය සභාව සතු මං මාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කේ. විල්බට් කුලතුංග,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
රිදීගම.

**එගොඩමුල්ල සමාගම් වත්ත මාර්ගය**

| *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *අවසානය* | *මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම්* | *මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම්* | *ග්‍රාම නිලධාරි වසම සහ අංකය* | *මාර්ගයේ දිග අඩි* | *මාර්ගයේ පළල අඩි* |
|---|---|---|---|---|---|---|---|
| එගොඩමුල්ල සමාගම්වත්ත මාර්ගය | ගල්ලව සිට එගොඩමුල්ල දක්වා වන මාර්ගයේ ජී. ජී. සරත් අමරසිංහ මහතාගේ නිවස අසළින් ආරම්භ වීම. | ජී. ජී. ආනන්ද ජයකොඩි මහතාගේ ඉඩම දක්වා | 1. ජී. ජී. සරත් අමරසිංහ මයා<br>2. ඊ. ඩී. අමිල ශලිත ජයසිංහ මයා<br>3. ආර්. රම්‍යා කමල් ගුණරත්න මිය<br>4. ආර්. ලලනි රසිකා ගුණරත්න මිය<br>5. ආර්. ඩබ්. ආර්. එම්. ඒ. මධුභාෂනී රණවාරණ මිය<br>6. ආර්. ඩී. සුනිල් ජයසූරිය මයා<br>7. ටී. ජී. අනිල් කුමාර විමලසේන මයා<br>8. ටී. ජී. චන්දන සමන් කුමාර මයා<br>9. ජී. ජී. ආනන්ද ජයකොඩි මයා | 1. ඊ. ඩී. අමිල ශාලිත ජයසිංහ මයා<br>2. ආර්. රම්‍යා කමල් ගුණරත්න මිය<br>3. ආර්. ලලනි රසිකා ගුණරත්න මිය<br>4. ආර්. ඩබ්. ආර්. එම්. ඒ. මධුභාෂනී-රණවාරණ මිය<br>5. ආර්. ඩී. සුනිල් ජයසූරිය මයා<br>6. ටී. ජී. අනිල් කුමාර විමලසේන මයා<br>7. එම්. ඩී. නිමල් ජයතිස්ස මයා<br>8. ජී. ජී. ආනන්ද ජයකොඩි මයා | ගල්ලව 576 | අඩි 1435 | අඩි 10 |

එච්.පී.එස්.හෙට්ටිආරච්චි
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ තලම්පිත,
වදාකඩ පාර,
පොතුහැර.


පිඹුරු අංකය: 2069A

ගල්ලෑව - එගොඩමුල්ල මාර්ගයේ සිට පල්ලෙමුල්ලතැන්න, කිරමනාඋල්පොතේ හේන නමැති ඉඩම් තුලින් පී.පී. ආනන්ද ජයකොඩි මයාගේ ඉඩම තෙක් පවතින මාර්ගය

ගම : ගල්ලෑව
ග්‍රාම නිලධාරී කොට්ඨාශය : අංක 576, ගල්ලෑව
ප්‍රා.ලේ.කොට්ඨාශය : රිදීගම
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : රිදීගම
දිස්ත්‍රික්කය : කුරුණෑගල
පළාත : වයඹ

පරිමාණය 1:2000

මාර්ගයේ දිග : මීටර් 437.5 (අඩි 1435) යි
මාර්ගයේ පළල : අඩි 10 යි




| කැබලි අංකය | බිම් ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ. | රූ. | ප. |
| 1 | 0.1391 | 0 | 1 | 15.0 |
| එකතුව | 0.1391 | 0 | 1 | 15.0 |

ඉඩමේ මායිම් පිඹුරේ සඳහන් පරිදි වේ
මනින ලද දිනය : 2017.09.05

06-967

## බදුල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ, බදුල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය සභාවේ 2018.05.10 වැනි දින පැවති මාසික මහ සභා රැස්වීමේදී සම්මත කර ගන්නා යෝජනාව මහජනතාවගේ දැන ගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ. යෝජිත කරුණු සම්බන්ධයෙන් ඉඩම් හිමියන් හෝ ප්‍රදේශවාසීන්ගේ විරෝධතා ඇත්නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වී දින 14ක් තුළදී හේතු ඇතුළත්ව පිටපත් දෙකකින් මා වෙත ඉදිරිපත් කළ යුතු වේ. මෙකී කලය තුළ විරෝධතාවයක් නොමැති වුවහොත් ඉන් පසු එම මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ග ලෙස සලකනු බවත් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය සභාවේ 2018.05.10 වැනි දින පැවති මහ සභාවේ උපලේඛනයේ සඳහන් මාර්ග නාමලේඛනය දිග හා පළල ප්‍රමාණයන් අනුව බදුල්ල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති, එම්. එම්. රම්‍යසිරි මන්තිලක මහතාගේ හා බදුල්ල ප්‍රාදේශීය සභාවේ විපක්ෂ මන්ත්‍රී දී. මු. ජයසේකර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. එම්. රම්‍යසිරි මන්තිලක,
සභාපති,
බදුල්ල ප්‍රාදේශීය සභාව.

බදුල්ල ප්‍රාදේශීය සභා මාර්ගයේ ගැසට් කිරීමට ඇති නියමිත මාර්ග විස්තරය

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග (m)* | *පළල (m)* |
|---|---|---|---|
| 01 | වියදිගුණ තැපැල් කන්තෝරුව අසල සිට නිකපොත දක්වා ඇති මාර්ගය | 220.00 | 3.66 |
| 02 | වියදිගුණ මාර්ගයේ සිට තොරිස්වත්ත දක්වා ඇති මාර්ගය | 492.00 | 3.66 |
| 03 | විනීතගම ප්‍රධාන මාර්ගයේ සිට පිටමංඅරාව වේවැස්ස ගම මාර්ගය | 1473.00 | 3.66 |
| 04 | විනීතගම මාර්ගයේ සිට ප්‍රාදේශීය සභාව අසලින් පස්සර පාරට ඇති මාර්ගය | 88.00 | 3.66 |
| 05 | ඕතලාව පාලම අසල සිට විනීතගම ප්‍රධාන මාර්ග දක්වා දිවෙන මාර්ගය | 778.00 | 3.66 |
| 06 | ජයගම පහළ මාර්ගය | 656.00 | 3.66 |
| 07 | හැගොඩ හම්බාවෙල මාර්ගය | 548.00 | 3.66 |
| 08 | අන්දෙණිය ඇල පාරේ සිට අත්වැල් පාලම දක්වා දිවෙන මාර්ගය | 538.00 | 3.05 |
| 09 | අන්දෙණිය කුරුගහපතන මාර්ගය | 1434.00 | 3.66 |
| 10 | නෙළුම්ගම ගොවිපල මාර්ගය | 258.00 | 3.66 |
| 11 | සිරිමල්ගොඩ සූරියමණ්ඩිය මාර්ගය | 1174.00 | 3.66 |
| 12 | ඉළුක්තැන්න බෝධිය අසල සිට අලවතුතැන්න සුසානභූමිය දක්වා මාර්ගය | 339.00 | 3.05 |
| 13 | ජයගම වනවගා කාර්යාල මාර්ගය | 620.00 | 3.66 |
| 14 | පස්සර ප්‍රධාන මාර්ගයේ සිට උඩවෙල ගම දක්වා දිවෙන මාර්ගය | 231.00 | 3.05 |
| 15 | දමන්වර එගොඩපිටිය මාර්ගය | 571.00 | 3.66 |
| 16 | හින්නාරංගොල්ල යොදුනුල්පොත මාර්ගය | 415.00 | 3.66 |
| 17 | මලංගමුව සංස්කෘතික මධ්‍යස්ථානය අසල සිට දේවාල අසලට යන මාර්ගය | 136.00 | 3.05 |
| 18 | විනීතගම සිට මොරගොල්ල දක්වා මාර්ගය | 330.00 | 3.66 |
| 19 | පස්සර මාර්ගයේ උඩවෙල ගම සිට භාරති මහා විද්‍යාලය දක්වා ඇති මාර්ගය | 355.00 | 3.05 |
| 20 | බණ්ඩාපුර නළ ළිඳ අසල සිට නිවාසවලට යන මාර්ගය | 80.00 | 3.66 |
| 21 | සමගිගම ඉහළ මාර්ගය | 401.00 | 3.66 |
| 22 | බදුළුසිරිගම සමුපකාරය අසල සිට සිරිමල්ගොඩ ඇළ දක්වා මාර්ගය | 146.00 | 3.05 |
| 23 | බදුළුසිරිගම කළු ටැංකිය දක්වා මාර්ගය | 405.00 | 6.10 |
| 24 | බදුළුසිරිගම ළදරු පාසල අසල සිට පහල මාර්ගය | 243.00 | 6.10 |
| 25 | විනීතගම සායන මධ්‍යස්ථානයේ සිට අම්පිටිය පතන මාර්ගය | 446.00 | 3.66 |
| 26 | සිරිමල්ගොඩ කටුකැලේ සිට සිරිමල්ගොඩ මැද මංකඩ පාලම දක්වා මාර්ගය | 1,220.00 | 3.66 |
| 27 | මලංගමුව ප්‍රධාන මාර්ගයේ සිට ඉළුක්තැන්න මාර්ගය (සොහොන අසලින්) | 2,240.00 | 4.57 |
| 28 | මලංගමුව ප්‍රධාන මාර්ගයේ සිට ඉළුක්තැන්න මාර්ගය | 2,240.00 | 4.57 |
| 29 | සමගිගම පහල මාර්ගය (මලංගමුව දක්වා මාර්ගය) | 472.00 | 6.10 |
| 30 | තෙල්බැද්ද මාර්ගය සිට මලංගමුව දක්වා මාර්ගය (සභාව ඉදිරිපිට) | 361.00 | 3.66 |

මෙම මාර්ග මැන පිඹුරුපත් සකස් කර ඇත.

06-954

## මීගමුව මහා නගර සභාව

2018 පරිපූරක අයවැය ලේඛනය අංක 01

මීගමුව මහා නගර සභාවේ 2018.07.05 දිනැතිව පැවැත්වීමට නියමිත මහා සභාවට ඉදිරිපත් කළයුතු 2018 වර්ෂයේ අංක 01 දරන පරිපූරක අයවැය ලේඛනය 2018.06.26 දින සිට දින 07ක් මහජන පරීක්ෂණය සඳහා නාගරික ගණකාධිකාරී දෙපාර්තමේන්තුවේ තබා ඇති බව 252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 214 (ආ) යටතේ දැනුම් දෙමි.

ඩබ්. එම්. දයාන් ලාන්සා,
නගරාධිපති,
මහා නගර සභාව,
මීගමුව.

06-95

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.